## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව - 2014

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ හා එහි පරිපාලිතයෙහි 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 31 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයෙහි දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

**(අ) තත්ත්වාගණනය කළ මතය - (ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව)**

මෙම වාර්තාවේ 2.2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**(ආ) තත්ත්වාගණනය කළ මතය - සමූහය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ හා එහි පරිපාලිතයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 සමූහයේ මූල්‍ය ප්‍රකාශන**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවට 2/3ක කොටස් අයත් පරිපාලිතයක් වන ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගමේ (CPSTL) විගණකවරුන් පහත දැක්වෙන කරුණු පදනම් කර ගෙන සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණි.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සකසුරුවම් සමිතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණිත මූල්‍ය ප්‍රකාශන 2015 අගෝස්තු 31 දින වන විටත් ලැබී නොතිබුණි. කෙසේ වෙතත් 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණිත මූල්‍ය ප්‍රකාශන අනුව රු.580,812,190ක සමුච්චිත ඍණ සංචිතයෙහි ප්‍රතිඵලයක් වශයෙන් රු.1,254,783,349ක නොබැඳුණු ඍණ සංචිත වාර්තා වී තිබුණි. කෙසේ නමුත් ඉහත ඍණ සංචිත තත්ත්වය සමාගමේ කටයුතු කෙරෙහි බලපෑමක් ඇති නොවන බවත් එහි කටයුතු අඛණ්ඩව ඉදිරි කාලයක් සඳහා සිදු කළ හැකි බවත් දක්වා තිබුණි.

(ආ) ඉහත තත්ත්වාගණනයට අමතරව ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගමේ (CPSTL) විගණකවරුන් පහත කරුණු කෙරෙහි අවධානය යොමු කර තිබුණි.

(i) මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර ඇති සටහන් අංක 4 අනුව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඉන්දියානු තෙල් සමාගම (LIOC) සහ ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම අතර පොදු භාවිත පහසුකම සඳහා එළඹ තිබූ අවබෝධතා ගිවිසුම 2008 දෙසැම්බර් 31 දින අවසන් වී තිබුණි. කෙසේ නමුත් අවබෝධතා ගිවිසුම අළුත් කිරීම හෝ දීර්ඝ කිරීම අවසන් කර නොතිබූ අතර ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව පසුව සිදුකළ වෙනස්කම් හා අවබෝධතා ගිවිසුමේ ඇති කොන්දේසි සැලකිල්ලට ගෙන ඉහත දැක්වූ අවබෝධතා ගිවිසුමේ දක්වා ඇති පරිදි ආදායම් හා වියදම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

අවබෝධතා ගිවිසුමක් නොතිබීම නිසා නිම කරනු ලබන අවබෝධතා ගිවිසුම අතීතානුයෝගීව බලපාන පරිදි ක්‍රියාත්මක කළ හැකි බැවින් වාර්තා කර ඇති ප්‍රතිඵල ප්‍රමාණාත්මකව නිවැරදි කිරීම් කිරීමේ අවිනිශ්චිතතාවයක් පවතී.

(ii) මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 14.1 අනුව, ලැබුණු තහවුරු කිරීම් මත සම්බන්ධිත පාර්ශවයන්ගෙන් වටිනාකම රු.මිලියන 135ක් වූ ලැබිය යුතු දේ සම්බන්ධයෙන් මතභේදයක් තිබූ අතර ඒ සඳහා මූල්‍ය ප්‍රකාශනවල හායනය සඳහා කරන ලද ඉඩ දීමක් ඇතිකර තිබුණි.

(iii) මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 5 හි විස්තර කර ඇති පරිදි ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම ඛනිජ තෙල් ප්‍රවාහනයෙන් රු.මිලියන 473.82ක (2013 වර්ෂය සඳහා පාඩුව රු. මිලියන 526ක් විය) පාඩුවක් දරා තිබූ අතර ණය පොළී ප්‍රතිපූරණයෙන් රු. මිලියන 150.08ක (2013 වර්ෂය සඳහා අලාභය රු.මිලියන 117.76ක) ලාභයක් උපයා තිබුණි.

(ඈ) ඉහත 2.2.1(ආ) (ii) ඡේදයේ සඳහන් එකඟ නොවූ ශේෂයෙන් රු. මිලියන 129ක් මේ වන විටත් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ලැබිය යුතු විය.

(ඈ) 2014 දෙසැම්බර් 31 දිනට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම අතර අන්තර් සමාගම් ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂයන් සම්බන්ධයෙන් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල වෙනම හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.2 සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන

#### 2.2.2.1 සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම

සංස්ථාව සමාලෝචිත වර්ෂය තුලදී මෙහෙයුම් කටයුතුවලින් රු. මිලියන 1,854ක බදු පූර්ව ශුද්ධ ලාභයක් ලබා තිබුණු නමුත් ශුද්ධ වත්කම්වල රු. මිලියන 231,532ක ඍණ තත්ත්වයක් පැවතීම කෙරෙහි මාගේ අවධානය යොමු කරන ලදී. තවද, 2012 වර්ෂයේ ඇතිකරගෙන තිබුණු ඉදිරි සුරැකුම් (Hedging) ගනුදෙනුව හේතුවෙන් ඇතිව තිබූ ඍණාත්මක බලපෑම පසුගිය වර්ෂවල ශුද්ධ පාඩුව වැඩි වීමට හේතු විය. සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය කාර්යසාධනය වර්ධනය වී තිබුණද, 2008 වර්ෂයේ සිට අධික අලාභ ලැබීම සංස්ථාවේ ශුද්ධ වත්කම් තත්ත්වය අඛණ්ඩව බාදනය වීමට හේතු වී තිබුණි. එබැවින් රජයේ මූල්‍ය සහාය නොමැතිව සංස්ථාව අඛණ්ඩව පවතින ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාමේ හැකියාව සැක සහිතය.

#### 2.2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රීලංගිප්‍ර) පිළිනොපැදීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) **ශ්‍රී.ලං.ගි. ප්‍රමිති 1 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

එක්සත් ජනපද ඩොලර් පදනමින් ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතයට (LIBOR) සියයට 4ක් එකතු කරන ලද පොළියක් මත, ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමාගමෙන් ලැබිය යුතු වූ එකතුව එක්සත් ජනපද ඩොලර් මිලියන 121.17ක මුදලක් 2012 ජූලි 05 දින ණය මුදලකට පරිවර්තනය කර තිබූ අතර එය හිඟ හිටි වෙළඳ ණය පියවීමක් ලෙස කාර්තු පදනමින් වර්ෂ 4ක් තුළ ගෙවිය යුතු විය. එසේ වුවද, ප්‍රමිතියේ නියම කර ඇති පරිදි මෙම ණය මුදලේ ජංගම හා ජංගම නොවන වත්කම් ප්‍රමාණයන් 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම දක්වා නොතිබුණි.

**(ආ) ශ්‍රී.ලං.ගි. ප්‍රමිති 8 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් හා වැරදි**

සංස්ථාවේ ගිණුම්වල සටහන් කර නොතිබූ, 2012 වර්ෂයට පෙර ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම විසින් ප්‍රකාශ කරන ලද රු. මිලියන 437.5ක් වූ ලාභාංශ පෙර වර්ෂවලට අදාල අයිතම ලෙස සලකා කටයුතු කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වෙනත් මෙහෙයුම් ආදායම් ලෙස දක්වා තිබුණි.

**(ඇ) ශ්‍රී.ලං.ගි. ප්‍රමිති 19 - සේවක ප්‍රතිලාභ**

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 3.2 අනුව, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල (SMEs) භාවිතය සඳහා පමණක් අවසර දෙනු ලැබූ මෘදුකාංගය භාවිතයෙන් **ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය** යොදා ගෙන සංස්ථාව විසින් විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය ගණනය කර තිබුණි. ඒ අනුව, ප්‍රමිතියේ සඳහන් නියමයන්ට අනුකූලව පාරිතෝෂිත සඳහා වෙන් කිරීම් සිදුකර නොතිබුණි.

**(ඇ) ශ්‍රී.ලං.ගි. ප්‍රමිති 37 - වෙන් කිරීම්, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්**

(i) ලබා දී තිබූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය අවසානයට නොවිසඳුණු නඩු 203 ක් පැවති අතර මෙයින් නඩු 108ක් රු.40,519,746ක, එ.ජ.ඩො. 21,990,231ක, බ්‍රිතාන්‍ය පවුම් 12,595ක සහ යූරෝ 74,817ක වන්දි ඉල්ලා සංස්ථාවට එරෙහිව පවරා තිබුණි. එසේම, රු.5,464,489,715ක් සහ එ.ජ.ඩො. 352,794ක් වන්දි ඉල්ලා නඩු 14ක් සංස්ථාව විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව පවරා තිබුණු බව නිරීක්ෂණය විය. තවද, ඉහත සඳහන් නඩු 203 අතුරින් නඩු 197ක් 2015 ජූනි 30 දින වන විටත් නොවිසඳී පැවතුණි. එසේ වුවත්, සංස්ථාව විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව ගොනු කර තිබූ නඩු හතක් (7) පිළිබඳ පමණක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල (හිමිකම් පෑ වටිනාකම හැර) හෙළිදරව් කර තිබුණි. මේ අනුව, ප්‍රමිතියට අනුකූල වන පරිදි නීතිමය වගකීම් වෙනුවෙන් ප්‍රමාණවත් වෙන් කිරීම් හෝ හෙළිදරව් කිරීම් සමාලෝචිත වර්ෂය අවසානයට වූ මූල්‍ය ප්‍රකාශනවල සිදු කර නොතිබුණි.

(ii) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා පෙට්‍රෝලියම් නිෂ්පාදිත සැපයුම්කරුවන් අතර ඇතිකර ගත් ගිවිසුමේ සාමාන්‍ය කොන්දේසිවලට අනුව සුදුසුකම් ලැබූ ලංසුකරු නැව් බඩු තොගය එකඟ වූ කාල පරිච්ඡේදය තුළ භාරදීම සඳහා වගකීමට බැඳෙන අතර එය ඉටු කිරීමට නොහැකි වුවහොත් ප්‍රමාද වන සෑම දිනක් සඳහාම නැවෙන් භාරදීමේ (DES) වටිනාකමින් සියයට 0.04ක දඩ මුදලක් ගෙවීමේ පූර්ණ වගකීමට බැඳෙනු ලැබේ. ඒ අනුව, එක්සත් ජනපද ඩොලර් 383,537.7කට සමාන රු.50,074,682ක දඩ මුදලක් සමාලෝචිත වර්ෂය තුලදී පෙට්‍රෝලියම් සැපයුම්කරුවන්ට පනවා තිබුණි. එසේ වුවත්, මෙම දඩ මුදල්වලට අදාලව සංස්ථාවේ ගිණුම් පොත්වල අවශ්‍ය ගිණුම්කරණ පිළියම් සිදු කිරීමට හෝ ප්‍රමිතියට අනුකූලව අවශ්‍ය හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශන තුල සිදු කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා ඇති තෙල් ගබඩා කිරීමේ හා බෙදා හැරීමේ සේවාවන් සැපයීමේ ආදායම වන රු. මිලියන 10,185.5 සමග සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා ඇති ඊට අනුරූප වියදම (නිමා ගාස්තු සහ ප්‍රවාහන

ගාස්තු - throughput and transport charges) වන රු. මිලියන 9,772.6 සැසඳීමේදී රු. මිලියන 412.9ක වෙනසක් නිරීක්ෂණය විය. එසේ වුවත්, ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලියේදී මෙම වටිනාකම් දෙක සැසඳීමකින් තොරව රු. මිලියන 9,772.6ක් වූ මුදල පමණක් ඉවත් කර තිබුණු අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් සමාලෝචිත වර්ෂය සඳහා වූ ඒකාබද්ධ විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ පර්යන්ත ගාස්තු හා අනෙකුත් ආදායම් රු. මිලියන 412.9ක් වැඩියෙන් දක්වා තිබුණි.

තවද, 2005 සිට 2007දක්වා කාල පරිච්ඡේදය තුළදී සංස්ථාව විසින් ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම වෙත පර්යන්ත ගාස්තු වශයෙන් වැඩිපුර ගෙවා තිබූ රු. මිලියන 1,065.4ක මුදල සංස්ථාවේ අදාල මූල්‍ය ප්‍රකාශනවල ලැබියයුතු මුදලක් ලෙස හඳුනාගෙන නොතිබුණු අතර 2014 වර්ෂය තුළදී ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගමට ගෙවිය යුතු පර්යන්ත ගාස්තු වලින් මෙම මුදල අයකර ගැනීමට තීරණය කර තිබුණි. කෙසේ වෙතත් එය වැරදි සහගත ලෙස සමාලෝචිත වර්ෂයේ පර්යන්ත ගාස්තු වියදම් ගිණුමට බැර කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

තවද, ඉහත දැක්වූ පරිදි වටිනාකම රු. මිලියන 1,065.4ක් වූ පර්යන්ත ගාස්තු සඳහා සංස්ථාව විසින් කරන ලද ගැළපීම ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ගළපා නොතිබුණු බැවින් සමූහයේ මූල්‍ය ප්‍රකාශනයන්හි අන්තර් සමාගම් ගනුදෙනු ඉවත් කර නොතිබුණි.

(ආ) විගණනයට ලැබී ඇති තොරතුරු අනුව, 2014 වර්ෂයේදී නැව් පමා කුලී වශයෙන් එ.ජ.ඩොලර් 1,795,798.7ක් ඉන්ධන සැපයුම්කරුවන් විසින් ඉල්ලුම් කර තිබූ අතර ඉන් එ.ජ.ඩොලර් 1,398,764.8කට සමාන රු.182,622,732ක් සංස්ථාව විසින් ගෙවීමට එකඟ වී තිබූ බව නිරීක්ෂණය විය. එසේ වුවත්, මෙම වගකීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි හඳුනාගෙන නොතිබුණු අතර මෙහි ප්‍රතිඵලයක් ලෙස 2014 දෙසැම්බර් 31 දිනට වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ රු.182,622,732ක් අඩුවෙන් හා සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් පෙන්නුම් කර තිබුණි. 2014 වර්ෂය අවසානයට සංස්ථාව විසින් නිශ්චිතව ගණනය කර නොතිබූ නමුත් ඉන්ධන සැපයුම්කරුවන් විසින් ඉල්ලුම් කර තිබූ ඉතිරි නැව් පමා කුලී ශේෂයට අදාල අසම්භාව්‍ය වගකීම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) වර්ගීකරණ දෝෂයක් හේතුවෙන් සම්බන්ධිත පාර්ශවයන්ට ගෙවිය යුතු දෑ හා උපචිත වියදම් රු. මිලියන 281 බැගින් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුල පෙන්වා තිබුණි.

(ඈ) 2014 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ හා ලංකා විදුලි බල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල ඉන්ධන සැපයීම හා මිලදී ගැනීම්වලට අදාලව වෙළඳ ලැබිය යුතු හා ගෙවිය යුතු දෑ විශ්ලේෂණය කිරීමේදී එම සංඛ්‍යා අතර රු.9,112,147ක වෙනසක් නිරීක්ෂණය විය. මෙය ලංකා විදුලි බල මණ්ඩලයට ඉන්ධන අඩුවෙන් සැපයීම නිසා සිදු වූවක් බව නිරීක්ෂණය විය. තවද, මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයකින් පසු මූල්‍ය ප්‍රකාශනවල ගැළපීම් කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

(ඉ) 2014 දෙසැම්බර් 31 දිනට ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනයට අදාලව ණයවර ලිපි මත බැංකුවලට ඇති බැඳීම් සහ ප්‍රතිග්‍රහණය කිරීම් එකතුව වන ඇ.එ.ජ ඩොලර් මිලියන 1,033කට සමාන රු. මිලියන 137,843ක් සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවලින් අතහැරී තිබුණි.

**2.2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුළු වෙළඳ ණය ප්‍රමාණය වූ රු.37,059,955,539න් රු.6,077,704,933ක් හා රු.30,982,250,606ක් පිළිවෙලින් රාජ්‍ය ආයතන වලින් සහ පුද්ගලික ආයතන වලින් ලැබිය යුතුව තිබුණි.

2014 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ හිඟ හිටි ශේෂ පිළිබඳ විස්තර ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දක්වා ඇත.

| වර්ගය | දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුළු මුදල | |
|---|---|---|
| | 2014 | 2013 |
| | රු. | රු. |
| බෙදුම්කරුවන් | 729,257,403 | 1,017,123,765 |
| ගුවන්සේවා | 22,938,329,447 | 34,725,218,564 |
| විදුලි ජනක පිරියත (ලං.වි.ම) | 3,087,458,385 | 7,154,095,254 |
| විදුලි ජනක පිරියත (පුද්ගලික) | 2,013,089,325 | 5,412,175,605 |
| රජයේ පාරිභෝගිකයින් | 2,990,246,548 | 2,617,900,530 |
| පුද්ගලික පාරිභෝගිකයින් | 529,231,709 | 1,709,489,885 |
| කෘෂි රසායනික | 24,549,928 | 23,639,740 |
| ලිහිසි තෙල් | 529,665,978 | 527,351,340 |
| ඉන්ධන පිරවුම් | 1,664,776,859 | - |
| වතු | 1,123,496 | - |
| අපනයන | 2,552,226,461 | - |
| අනෙකුත් | - | 2,681,505 |
| එකතුව | **37,059,955,539** | **53,189,676,188** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී දින 2 ණය බෙදුම්කරුවන් විසි එක්දෙනෙකුට (පර්යන්තයෙන් හා ඩිපෝවලින් චෙක්පත් බැංකුගත කිරීම ප්‍රමාද වීම හේතුවෙන්), විදුලි ජනක පිරියත ගනුදෙනුකරුවන් හතර දෙනෙකුට හා ගුවන්සේවා ගනුදෙනුකරුවන් අට දෙනෙකුට බැංකු ඇපකර වටිනාකම් සීමාව ඉක්මවා ණය පහසුකම් ලබා දී තිබූ අවස්ථා නිරීක්ෂණය විය.

(ආ) යුධ කාල සීමාව තුල විශේෂ ණය පහසුකම් පදනම මත දින 5 ණය බෙදුම්කරුවෙකු සඳහා විශේෂ ණය පහසුකම් සපයා තිබුණු අතර තවත් දින 5 ණය බෙදුම්කරුවෙකුට ඔහුගේ විශේෂ ඉල්ලීමක් පරිදි විධිමත් අනුමැතියකින් තොරව විශේෂ ණය පහසුකම් ලබාදීම සිදුකර තිබුණි. තවද, ගිවිසුමක් මත විදුලිජනක පිරියත ගනුදෙනුකරුවකුට ණය පහසුකම් කාලය දීර්ඝ කර තිබුණි. කෙසේ වෙතත් පාරිසරික වෙනස්කම් හා අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීම පිළිබඳ සලකා බැලීමකින් තොරව මෙම පහසුකම් දිගු කාලයක් මුළුල්ලේ අඛණ්ඩව ලබා දී තිබීම විගණනයේදී ප්‍රශ්නකාරී විය. සමාලෝචිත වර්ෂය තුලදී විශේෂ ණය පහසුකම් සැපයූ ප්‍රමාණය සහ 2014 දෙසැම්බර් 31 දිනට මෙම ගනුදෙනුකරුවන්ගේ හිඟ හිටි ශේෂය පිළිවෙලින් රු. මිලියන 52,704.5ක් හා රු. මිලියන 23,948ක් විය.

(ඇ) 2006 අගෝස්තු 08 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය සහ සංස්ථාවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය මූල්‍ය කළමනාකරු (ආදායම්) ගේ 2008 මාර්තු 24 දිනැති ලිපිය අනුව, සියයට 24 ක වාර්ෂික

පොළී අනුපාතයක් ගනුදෙනුකරුවන්ගේ වැඩියෙන් ලබාගෙන ඇති ණය ශේෂය මත අය කර ගත යුතුවේ. කෙසේ වුවද, දත්ත සැකසීම සහ තොග මට්ටම් සුපරීක්ෂණය වෙනුවෙන් සංස්ථාව විසින් භාවිතා කර තිබූ ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම මඟින් හඳුන්වා දුන් හා ක්‍රියාත්මක කරන ලද ව්‍යවසාය සම්පත් සැලසුම් කිරීම (ERP) සඳහා වන පද්ධතියට අදාල දත්ත ක්‍රියාවලි පද්ධතිය (SAP) මඟින් ණය කාලය ඉක්මවූ නොපියවූ ඉන්වොයිස් මත පොළී ගණනය කිරීමේ පහසුකම ඇතිකර නොතිබුණි. එම නිසා සංස්ථාව නොපියවූ ඉන්වොයිස් සඳහා වන පොළිය අතින් ගණනය කර දත්ත ක්‍රියාවලි පද්ධතිය (SAP) යාවත්කාලීන කර තිබුණි. ඒ අනුව, වැඩියෙන් ලබාගෙන ඇති ණය ශේෂ මත අය කරනු ලබන පොළියෙහි නිවැරදිභාවය හා සම්පූර්ණභාවය පිළිබඳ සහතික වීමට හැකි වන පරිදි විධිමත් පද්ධතියක් නිර්මාණය කර ක්‍රියාත්මක කිරීමට සංස්ථාව විසින් කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

### 2.2.2.5 ඉදිරි සුරැකුම් (Hedging) ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉදිරි සුරැකුම් ගනුදෙනුවලට අනුව වාණිජ බැංකු කීපයක් සමඟ එළඹ තිබුණු ඉදිරි සුරැකුම් ගිවිසුම් සම්බන්ධයෙන් බේරුම් කිරීමේ ක්‍රියාවලියේ පාර්ශවයක් වශයෙන් සංස්ථාව කැඳවා තිබුණි. පාර්ශව අතර එළඹ තිබූ බේරුම් කිරීමේ ඔප්පුව යටතේ එ.ජ.ඩො. මිලියන 60ක් (රු. මිලියන 7,612ක්) ස්ටෑන්ඩඩ් චාටර්ඩ් බැංකුවට (SCB) 2013 ජූනි 03 දින ගෙවා තිබුණි. ලැබී ඇති තොරතුරුවලට අනුව, රු.5,261,827ක ගමන් වියදම්ද ඇතුළුව 2014 දෙසැම්බර් 31 දිනට සංස්ථාව දරා ඇති පාඩුව රු. මිලියන 9,780ක් විය.

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉදිරි සුරැකුම් ගනුදෙනුවලට අදාලව නීති වියදම් වශයෙන් රු. මිලියන 570.6ක් දරා තිබූ අතර ඉන් රු. මිලියන 567.5ක් 2011 සිට 2014 දක්වා කාලය තුල සංස්ථාව විසින් මහ බැංකුව වෙත ප්‍රතිපූරණය කර තිබුණි. ඊට අමතරව, සංස්ථාවේ ඉදිරි සුරැකුම් ගනුදෙනුවලට අදාලව ශ්‍රී ලංකා රජයට එරෙහිව ඩොයිෂ් බැංකුව ආරම්භ කර ඇති බේරුම් කිරීමේ ක්‍රියාවලිය සඳහා පෙනී සිටි විදේශ නීතිඥයින්ගෙන් ලබා ගත් සේවා සඳහා 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහ බැංකුව රු. මිලියන 378.7ක් ගෙවා තිබුණි.

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.2 වගන්තිය. | සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා අවම වශයෙන් ඛනිජ තෙල් කර්මාන්ත ක්ෂේත්‍රයේ සිටින එක් සාමාජිකයෙකු හෝ ඇතුලත්ව නොතිබුණි. |
| (ආ) 1997 ඔක්තෝබර් 24 දිනැති අංක 124 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛය. | පුරප්පාඩු තනතුරක රාජකාරි ආවරණය කිරීමේ කාලය මාස තුනක කාලයකට සීමා විය යුතු වුවත් සේවකයන් 29 දෙනෙකු විසින් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මාස 5 සිට වසර 4 ක කාලයක් පුරප්පාඩු තනතුරුවල රාජකාරී ආවරණය කර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.මිලියන 1,854ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ පාඩුව රු.මිලියන 7,889ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 9,743ක වර්ධනයක් දැක්වුණි. වටිනාකම රු. මිලියන 2,715ක් වූ භූමිතෙල් සහනාධාරය සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම, පසුගිය වර්ෂය සමඟ සැසඳීමේදී මූල්‍ය පිරිවැය රු. මිලියන 4,578කින් අඩු වීම, සංස්ථාවේ ඛනිජ තෙල් නිෂ්පාදන මිලදී ගැනීම් ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වර්ධනය වීම ආදිය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය වර්ධනය වීමට ප්‍රධාන වශයෙන් දායක වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ පරිපාලිතයේ මෙහෙයුම් කටයුතුවලින් රු. මිලියන 2,188ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය රු. මිලියන 1,602ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන 586ක වර්ධනයක් දැක්වුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ලාභදායීත්වය**


සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මෙහෙයුම්වලින් සියයට 4.88ක ආන්තිකයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේදී සියයට 4.86ක් වූ ආන්තිකය සමඟ සැසඳීමේදී සියයට 0.02ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. එසේම, සමාලෝචිත වර්ෂයේදී දළ ලාභය ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දළ ලාභය වූ රු. මිලියන 22,744 හා සැසඳීමේදී රු. මිලියන 1,703කින් හෙවත් සියයට 7.5කින් වැඩි වී තිබුණි.

| විස්තරය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | | වෙනස වාසිදායක/ (අවාසිදායක) | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | 2014 | 2013 | | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| ආදායම | 525,182 | 490,381 | 34,801 | 7.1 |
| විකුණුම් පිරිවැය | (500,735) | (467,637) | (33,097) | (7.1) |
| **දළ ලාභය** | **24,447** | **22,744** | **1,703** | **7.5** |
| අනෙකුත් ආදායම් | 3,866 | 374 | 3,492 | 934 |
| විකිණීමේ හා බෙදා හැරීමේ වියදම් | (11,533) | (11,965) | 432 | 3.6 |
| පරිපාලන වියදම් | (4,922) | (3,765) | (1,157) | (30.7) |
| **මෙහෙයුම් ලාභය** | **11,858** | **7,388** | **4,470** | **60.5** |
| මූල්‍ය වියදම් | (13,962) | (18,540) | 4,578 | 24.7 |
| මූල්‍ය ආදායම් | 3,958 | 3,262 | 696 | 21.3 |
| **ආදායම් බදු පෙර ලාභය/(පාඩුව)** | **1,854** | **(7,889)** | **9,743** | **123.5** |

**(ආ) ශුද්ධ ලාභය/(අලාභය)ට එරෙහිව ශුද්ධ වත්කම්**

2014 වර්ෂය සහ ඉකුත් වර්ෂ 6 සඳහා සංස්ථාවේ බදු පෙර ශුද්ධ ලාභය/(පාඩුව) හා ශුද්ධ වත්කම් තත්ත්වය පහත සඳහන් වගුවෙහි හා ප්‍රස්ථාරයෙහි දැක්වේ.

| වර්ෂය | ශුද්ධ ලාභය/(අලාභය) | වර්ෂය අවසානයට ශුද්ධ වත්කම් තත්ත්වය |
|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන |
| 2008 | (14,952) | (1,416) |
| 2009 | (11,353) | (13,038) |
| 2010 | (26,923) | (39,952) |
| 2011 | (94,503) | (131,324) |
| 2012 | (97,308) | (228,545) |
| 2013 | (7,926) | (236,467) |
| 2014 | 1,741 | (231,532) |




අඩු ආන්තිකයක් සහිත වූ අකාර්යක්ෂම පිරිපහදු ක්‍රියාවලිය, අඩු එලදාව හා පිරිපහදුවේ නිතර සිදුවන වැඩ නැවැත්වීම් හේතුවෙන් රටේ බනිජ තෙල් ඉල්ලුම සපුරාලීම සඳහා පිරිපහදු කරන ලද ඛණිජතෙල් නිෂ්පාදිත ආනයනය, පිරිපහදු පිරිවැයට වඩා අඩු මිලට නැප්තා සහ දැවි තෙල්-1500 අපනයනය, ගිවිසුම්ගත ගනුදෙනුකරුවන්ගේ මිලට වඩා අඩු සහන මිලකට සී/ස ශ්‍රී ලංකන් එයාර් ලයින් සමාගමට හා සී/ස මිහින් ලංකා සමාගමට ඉන්ධන සැපයීම, ඉදිරි සුරැකුම් ගනුදෙනු (Hedging) තුලින් ඇති වූ අධික අලාභ, ඉන්ධන බිල් සඳහා මූල්‍යයනය කිරීමට බැංකු අංශයෙන් ලබාගන්නා ණය සංස්ථාව විසින් වැඩි කිරීම සහ ඒ සඳහා අධික පොළී පිරිවැයක් දැරීම, ඛනිජතෙල් නිෂ්පාදිත ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අකාර්යක්ෂමතාවයන්, ලංකා විදුලිබල මණ්ඩලයට සහනදායී රේටයකට ඉන්ධන (දැවිතෙල් සහ නැප්තා) සැපයීම, විධිමත් තොග මට්ටම් නොමැතිකම, ගබඩා පහසුකම් නඩත්තු කිරීමේ දුර්වලතා, සැපයුම්කරුවන්ට නැව් පමා කුලී ගෙවීම, ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය අඛණ්ඩව හීන වීම ආදිය සංස්ථාවේ අඛණ්ඩ මූල්‍ය අලාභයන් හා ප්‍රාග්ධන ඛාදනය සඳහා හේතු වූ ප්‍රධාන කරුණු බව අනාවරණය විය.

සංස්ථාවේ ඇතිවී තිබුණු මූල්‍ය දුෂ්කරතාවලට මුහුණ දීම සඳහා 2014 සැප්තැම්බර් දක්වා ඛනිජ තෙල් නිෂ්පාදනවල දේශීය සිල්ලර මිල ගණන් අඛණ්ඩව ඉහළට සංශෝධනය කර තිබූ නමුත් ජාත්‍යන්තර ඉන්ධන මිල අඩු වීමට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුලදී දෙවරක් මිල ගණන් අඩු කර තිබුණි. එසේ වුවද, සංස්ථාව විසින් ජාත්‍යන්තර මිල වෙනස් වීම් හා රජයේ අරමුණුවලට සමගාමීවූ ඵලදායී මිලකරන උපාය මාර්ගයක් සැළසුම්කර ස්ථාපනය කර නොතිබුණි. 2014 වර්ෂයේදී සංස්ථාව විසින් ඛනිජ තෙල් නිෂ්පාදනවල සිල්ලර මිලෙහි සිදු කළ ප්‍රධාන වෙනස්කම් පහත පරිදි වේ.

| **ඛනිජ තෙල් නිෂ්පාදනය** | **ලීටරයක මිල (බලපැවැත්වෙන දිනය)** | | |
|---|---|---|---|
| | **2013 පෙබ. 23** | **2014 සැප්. 23** | **2014 දෙසැ.05** |
| | රු. | රු. | රු. |
| පෙට්‍රල් ඔක්ටේන් 95 | 170.00 | 165.00 | 158.00 |
| පෙට්‍රල් ඔක්ටේන් 92 | 162.00 | 157.00 | 150.00 |
| ලංකා ඔටෝ ඩීසල් | 121.00 | 118.00 | 111.00 |
| ලංකා සුපර් ඩීසල් | 145.00 | 140.00 | 133.00 |
| ලංකා භූමිතෙල් | 106.00 | 86.00 | 81.00 |
| ලංකා කාර්මික භූමිතෙල් | 115.00 | 115.00 | 110.00 |

**(ඇ) වැදගත් ගිණුම්කරණ අනුපාත**

ලැබී ඇති තොරතුරු අනුව සංස්ථාවේ සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| **අනුපාත** | **2014** | **2013** |
|---|---|---|
| <u>ලාභදායිත්ව අනුපාත</u> | | |
| දළ ලාභ අනුපාතය (%) | 4.66 | 4.64 |
| මෙහෙයුම් ලාභ අනුපාතය (%) | 2.26 | 1.51 |
| ශුද්ධ ලාභ අනුපාතය (%) | 0.35 | (1.61) |
| <u>ද්‍රවශීලතා අනුපාත</u> | | |
| ජංගම වත්කම් අනුපාත (වාර ගණන) | 0.39:1 | 0.39:1 |
| ක්ෂණික වත්කම් අනුපාත (වාර ගණන) | 0.23:1 | 0.24:1 |
| කාරක ප්‍රාග්ධනය (රු. මිලියන) | (252,233) | (257,124) |
| <u>ආයෝජන අනුපාත</u> | | |
| වත්කම් මත ප්‍රතිලාභ (%) | 0.95 | (4.23) |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉකුත් වර්ෂය හා සැසඳීමේදී දළ ලාභ අනුපාතය හා ශුද්ධ ලාභ අනුපාතය පිළිවෙලින් සියයට 0.02කින් හා සියයට 1.95කින් වර්ධනය වී තිබුණි.

(ii) 2014 වර්ෂයේ සංස්ථාවේ කාරක ප්‍රාග්ධන තත්ත්වය පසුගිය වර්ෂය සමඟ සලකා බැලීමේදී සුළු වශයෙන් වර්ධනය වී තිබුණි. කෙටිකාලීන ආයෝජන සහ මුදල් සහ

මුදල් හා සමාන දෑ වල වැඩි වීම හා වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දේ අඩු වීම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක වී තිබුණි.

## 4 මෙහෙයුම් සමාලෝචනය

### 4. 1 කාර්යසාධනය

2014 වර්ෂය සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව අනුව, 2014 වර්ෂය සඳහා ඛනිජ තෙල් නිෂ්පාදනවල (බොර තෙල් සහ පිරිපහදු කරන ලද නිෂ්පාදන) මුළු ආනයන පිරිවැය රු. බිලියන 600ක් වූ අතර එය 2014 වර්ෂය සඳහා පවතින වෙළඳපල අගය මත ගණනය කළ දළ දේශීය නිෂ්පාදනය (ද.දේ.නි.) වන රු. බිලියන 9,785න් සියයට 6.1ක් නියෝජනය කර තිබුණි. තවද, එය 2014 වර්ෂය සඳහා වන මුළු ආනයන වියදම වන රු. බිලියන 2,535න් ආසන්න වශයෙන් සියයට 24ක් පමණ නියෝජනය කරනු ලැබේ.

ආනයනය කළ බොර තෙල්වල සාමාන්‍ය මිල අඩුවී තිබීම සහ ඛනිජ තෙල් නිෂ්පාදනවල දේශීය සිල්ලර මිල වැඩි කිරීම (2014 සැප්තැම්බර් දක්වා) සිදුවී තිබූ නමුත් පහත දැක්වෙන නිෂ්පාදනයන්ගෙන් සංස්ථාව අඛණ්ඩව දළ පාඩු ලබා තිබුණි.

| අංශය | වර්ෂය සඳහා දළ අලාභය | | | |
|---|---|---|---|---|
| | 2014 | 2013 | 2012 | 2011 |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| **විදුලිබල උත්පාදන** | | | | |
| නැප්තා | 413 | 1,081 | 1,048 | 798 |
| **දේශීය** | | | | |
| LP ගෑස් (K.G.) | 312 | 436 | 377 | 224 |
| භූමිතෙල් | 1,775 | 2,449 | 3,525 | 6,886 |
| **අපනයන** | | | | |
| නැප්තා | 1,700 | 976 | 43 | 675 |
| දැවි තෙල් 1500 | 1,530 | 2,690 | 70 | 329 |
| **ඉන්ධන පිරවීම** | | | | |
| ඩීසල් | 168 | 67 | - | - |
| දැවි තෙල් 1500 | 1,123 | 729 | - | - |
| දැවි තෙල් 3500 | 19 | - | | |

එසේම පසුගිය වර්ෂය සමඟ සැසඳීමේදී පහත දැක්වෙන නිෂ්පාදනයන්ගෙන් සංස්ථාව අඛණ්ඩව ශුද්ධ අලාභ ලබා තිබුණි.

| අංශය | වර්ෂය සඳහා ශුද්ධ අලාභය | | |
|---|---|---|---|
| | **2014** | **2013** | **2012** |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| **ප්‍රවාහන අංශය** | | | |
| ඩීසල් | 5,759 | 6,235 | 29,654 |
| **විදුලිබල උත්පාදන** | | | |
| දැවි තෙල් 1500 | 299 | 1,240 | 34,959 |
| නැප්තා | 1,078 | 1,081 | 1,047 |
| **ගුවන් කටයුතු** | | | |
| ගුවන් යානා ඉන්ධන | 1,387 | 1,251 | 475 |
| **කර්මාන්ත සහ දේශීය** | | | |
| කර්මාන්ත භූමිතෙල් | 71 | 126 | 364 |
| දැවි තෙල් 1500 | 69 | 350 | 2,003 |
| දේශීය භූමිතෙල් | 2,715 | 2,449 | 3,525 |
| LPගෑස් | 431 | 436 | 482 |
| **අපනයන** | | | |
| නැප්තා | 1,799 | - | - |
| දැවි තෙල් | 1,627 | - | - |
| **ඉන්ධන පිරවීම** | | | |
| ඩීසල් | 240 | - | - |
| දැවි තෙල් 1500 | 1,392 | - | - |

2014 වර්ෂයේදී සංස්ථාවේ පාඩු ලැබූ නිෂ්පාදන ඉකුත් වර්ෂ දෙක සමඟ සසඳා ඉහත වගුවල දැක්වේ. ඒ අනුව 2014 වර්ෂයේදී ආරම්භ කළ අපනයන සහ ඉන්ධන පිරවීම් කටයුතුවලින් හැර අනෙකුත් සියළු නිෂ්පාදන කටයුතුවලින් සංස්ථාව අඛණ්ඩව පාඩු ලබා තිබූ අතර එම සියළු නිෂ්පාදන සංස්ථාවේ මූල්‍ය කාර්යසාධනය සහ මූල්‍ය තත්ත්වය කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කර තිබුණි.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය (ERP)**

ලංකා ඛනිජතෙල් ගබඩා පර්යන්ත සමාගම (CPSTL) විසින් හඳුන්වා දෙන ලද ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය (ERP) පිළිබඳ කටයුතු කිරීමේදී එක් එක් පාර්ශවයේ වගකීම් සම්බන්ධයෙන් සංස්ථාව, ලංකා ඛනිජතෙල් ගබඩා පර්යන්ත සමාගම සහ ලංකා ඉන්දියන් තෙල් සමාගම අතර ගිවිසුමක් හෝ අවබෝධතා ගිවිසුමක් ඇති කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. මේ අනුව, මෙම පද්ධතිය විශේෂයෙන් ඉන්ධන තොග සමාලෝචනය කිරීමේ කටයුතු සඳහා ප්‍රමාණවත් ලෙස උපයෝජනය කර නොතිබුණි.

**(ආ) සී/ස ශ්‍රී ලංකන් එයාර්ලයින් සමාගමට හා සී/ස මිහින් ලංකා (පුද්ගලික) සමාගමට සහන මිලට ඉන්ධන සැපයීම**

සී/ස ශ්‍රී ලංකන් එයාර්ලයින් සමාගම සහ සී/ස මිහින් ලංකා (පුද්ගලික) සමාගම කොන්ත්‍රාත් පාරිභෝගිකයන් වුවද, සංස්ථාව විසින් අතිවිශේෂ සහනදායී මිල ගණන්වලට ඉහත සමාගම් සඳහා ගුවන් සේවා ටර්බයින් ඉන්ධන අලෙවියෙන් 2011, 2012, 2013 සහ 2014 වර්ෂ සඳහා පිළිවෙලින් රු.මිලියන 669.77ක, රු.මිලියන 456.6ක, රු.මිලියන 2,009.68ක සහ රු.මිලියන1,903.38ක අලාභ දරා තිබුණි. විස්තර පහත පරිදි වේ.

| සමාගමේ නම | වර්ෂය තුලදී සංස්ථාව දරා ඇති පාඩුව | | | |
|---|---|---|---|---|
| | 2014 | 2013 | 2012 | 2011 |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමාගම | 1,762.27 | 1,866.39 | 423.97 | 627.16 |
| මිහින් ලංකා (පුද්ගලික) සමාගම | 141.11 | 143.29 | 32.58 | 42.61 |
| **එකතුව** | **1,903.38** | **2,009.68** | **456.55** | **669.77** |

සහනදායී මිල යටතේ මෙම සමාගම් දෙකට ඉන්ධන සපයා තිබියදීත්, ඔවුන්ගේ දුර්වල මූල්‍ය කාර්යසාධනය නිසා හිඟ හිටි ඉන්ධන බිල් පියවීම ඉතා දුර්වල තත්ත්වයක පැවතුණි. එනම් 2014 වර්ෂය සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව අනුව සී/ස ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමාගම රු. බිලියන 29ක මෙහෙයුම් අලාභයක් වාර්තා කර තිබූ අතර මිහින් ලංකා (පුද්ගලික) සමාගම රු. මිලියන 652ක ආන්තික මෙහෙයුම් ලාභයක් වාර්තා කර තිබුණි. 2010 වර්ෂයේ සිට හිඟ හිටි ශේෂයන්ගේ වර්ධනයේ උපනතිය පහත දැක්වේ.

| සමාගමේ නම | දෙසැම්බර් 31 දිනට හිඟ හිටි ශේෂය | | | | |
|---|---|---|---|---|---|
| | 2014 | 2013 | 2012 | 2011 | 2010 |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| සී/ස ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමාගම | 20,900.35* | 29,519.68* | 25,890.12* | 12,351.43 | 541.54 |
| සී/ස මිහින් ලංකා (පුද්ගලික) සමාගම | 1,338.73 | 4,313.68 | 3,416.10 | 1,227.02 | 361.24 |

*ඉහත 2.2.2.2 (අ) ඡේදයේ දක්වා ඇති 2012, 2013, හා 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා පිළිවෙලින් රු. මිලියන 14,726.6ක, රු. මිලියන 10,020ක හා රු. මිලියන 6,391ක හිඟ ණය ශේෂ මෙම ශේෂයන් තුල ඇතුලත් වේ.

2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුළු වෙළඳ ණය වටිනාකම වූ රු. මිලියන 37,060න් සියයට 60කට වඩා වැඩි ප්‍රමාණයක් ඉහත දැක්වූ සමාගම් දෙකෙන් ලැබිය යුතු වෙළඳ ණයවලින් නියෝජනය වී තිබුණි.

මේ සම්බන්ධයෙන් සංස්ථාවේ සභාපති පහත පරිදි කරුණු දක්වා තිබුණි.

*සී/ස ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමාගම සහ සී/ස මිහින් ලංකා (පුද්ගලික) සමාගම ජාතික වාහකයන් වන බැවින් රජයේ උපදෙස් පරිදි ඉන්ධන සැපයීම අඛණ්ඩව සිදුකරන ලදී*

**(ඇ) බැංකු අංශයෙන් ණය ලබා ගැනීම් ඉහළ දැමීම**

**-----------------------------------------------**

සංස්ථාව විසින් ඛණිජ තෙල් බිල්පත් පියවීම සඳහා බැංකු වලින් ණය ලබා ගෙන තිබූ අතර එය සංස්ථාවේ ලාභය අඩු වීමට හා සෘණ ශුද්ධ වත්කම් තත්ත්වය තවදුරටත් එසේ පැවතීමට හේතු වී තිබුණි. තවද, සංස්ථාව අඛණ්ඩව පසුගිය අනුයාත වර්ෂ පහ තුල සැලකිය යුතු වටිනාකමකින් ණය ගැනීම නිසා අධික මූල්‍ය පිරිවැයක් දරා තිබූ බව නිරීක්ෂණය වූ අතර එහි පහත විස්තර වන පරිදි වේ.

| වර්ෂය | දෙසැම්බර් 31 දිනට බැංකු අංශයෙන් ණය ලබා ගැනීම් | මූල්‍ය පිරිවැය |
|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන |
| 2010 | 168,020 | 6,859 |
| 2011 | 310,060 | 9,001 |
| 2012 | 399,520 | 18,360 |
| 2013 | 406,850 | 18,540 |
| 2014 | 376,607 | 13,962 |

මේ සම්බන්ධයෙන් සංස්ථාවේ සභාපති පහත පරිදි කරුණු දක්වා තිබුණි.

*මූල්‍ය පාඩු ආවරණය කර ගැනීම සඳහා සහනාධාර නොලැබීම බැංකු අංශයෙන් ණය ලබා ගැනීමට සිදුවීම ප්‍රධාන හේතුව විය.*

**(ඈ) තෙල් ප්‍රවාහන නල මාර්ග ජාලය**

**---------------------------------**

කොළඹ වරාය සිට කොළොන්නාව ඛණිජතෙල් ගබඩා පර්යන්තය දක්වා ආනයනික පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් සහ දැවිතෙල් වැනි ඛණිජ තෙල් නිෂ්පාදිත ප්‍රවාහනය කිරීම සඳහා දශක කිහිපයකට පෙර ස්ථාපනය කරන ලද නල මාර්ග අළුත්වැඩියා කළයුතු තත්ත්වයේ පවතින අතර ඉන් නල මාර්ග කිහිපයක් අළුත්වැඩියා කිරීමට නොහැකි තත්ත්වයේ පැවතීම හේතුවෙන් දැනටමත් අත්හැර දමා තිබුණි. ඛනිජ තෙල් නිෂ්පාදනවල ජාතික අවශ්‍යතාවයෙන් විශාල ප්‍රමාණයක් මෙම දිරාපත් වූ නල මාර්ග තුලින් කොලොන්නාව ඉන්ධන ගබඩා පර්යන්තයට ගෙන යන බැවින් මෙම නල මාර්ග අළුත්වැඩියා කිරීම හා නවීකරණය කිරීම වහා කළ යුතු අවශ්‍යතාවයක් වී ඇත. එම අබලන් වූ නල මාර්ග තුලින් ආනයනික පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රවාහනය කිරීම නිසා උග්‍ර ඉන්ධන අර්බුදයක් සමඟ මුළු රටම අකර්මන්‍ය වීමේ අවදානම විගණනයේදී බැහැර කළ නොහැක.

මුතුරාජවෙල පර්යන්තයේ සිට කි.මී. 7.2ක් හා මුහුදු වෙරළේ සිට කි.මී. 6ක් පමණ දුරින් මුහුද මැද පිහිටුවා ඇති සිංගල් පොයින්ට් බෝයි මූරින් පහසුකම මාර්ගයෙන් මුතුරාජවෙල ස්ථාපිතයට සැපයීම් සිදු කෙරෙන අතර, මුහුදු රළ තත්ත්වය ඉතා දැඩිවන අවස්ථාවලදී හෝ අදාල පහසුකම පිළිබඳ නඩත්තු කටයුතු සිදුවන අවස්ථාවලදී වෙනත් විකල්ප සැපයුම් මාර්ගයක් නොවීය. නිෂ්පාදිත අන්තර් පර්යන්ත මාරු කිරීම සඳහා මුතුරාජවෙල පර්යන්තය

හා කොළොන්නාව ස්ථාපිතය අතර සම්බන්ධකමක් නොවීම හේතුවෙන් එම පර්යන්ත දෙකෙහිම ප්‍රශස්ථ උපයෝජනයට බාධා මතුවී තිබුණි.

"රට හරහා නල මාර්ග ව්යාපෘතිය" ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2012 සැප්තැම්බර් 13 දින ලබා දී තිබුණද, එම ව්‍යාපෘතිය මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි.

මේ සම්බන්ධයෙන් සංස්ථාවේ සභාපති පහත පරිදි කරුණු දක්වා තිබුණි.

*නල මාර්ග පද්ධතිය ප්‍රතිස්ථාපනය කිරීම හා නඩත්තු කිරීම ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමට පවරා දී ඇත. කොළඹ වරායේ සිට කොලොන්නාව පර්යන්තය වෙත නිෂ්පාදන ප්‍රවාහනය කිරීම සඳහා නල මාර්ග තුනක් තිබේ. අඟල් 14 විශ්කම්භයෙන් යුතු නලය බොර තෙල් ප්‍රවාහනය සඳහා යොදා ගනු ලබන අතර අනෙකුත් නල පිළිවෙලින් අඟල් 12 හා 10 විශ්කම්භයෙන් යුතු වේ. මේවායින් අඟල් 12 විශ්කම්භයෙන් යුතු නලය පසුගිය කාලය තුල බරපතල ලෙස දිරාපත් වී තිබුණි. 2015 වර්ෂයේදී මෙම නලයෙන් සියයට 50 ක් පමණ නැවත සකස් කර තිබූ අතර ඉතිරි වැඩ කටයුතු දැනට සිදු කරමින් පවතී. එහි ප්‍රතිඵලයක් වශයෙන් 2015 වර්ෂයේදී නල වලින් කාන්දුවීම් වාර්තා වී නොමැත. අඟල් 10 විශ්කම්භයෙන් යුතු පිරිපහදු තෙල් නලය හොඳ තත්ත්වයේ පවතී. කෙසේ වෙතත් පවතින පිරිපහදු තෙල් නලයේ විශ්කම්භය වැඩි කිරීමට සහ පවතින නල මාර්ග යටිතල පහසුකම් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා නව අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලැබී තිබේ. එම නල මාර්ග ප්‍රතිස්ථාපනය කිරීම සඳහා අනාගතයේදී පියවර ගනු ලැබේ.*

*ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ 2015-2020 සඳහා වන ප්‍රාග්ධන අයවැය ලේඛනය යටතේ වර්ගීකරණය කර ඇති ප්‍රාග්ධන ව්‍යාපෘති තුලින් මුතුරාජවෙල හා කොලොන්නාව පර්යන්ත ඒකාබද්ධ කිරීම සලකා බලනු ලැබේ.*

**(ඉ) ධීවර කූපන් ක්‍රමය**

**------------------**

ධීවරයින්ට සහනදායී මිලට ඉන්ධන මිලදී ගැනීමට පහසුකම් සැලසීමේ අරමුණින් රජය විසින් 2012 වර්ෂයේදී හඳුන්වා දුන් ධීවර කූපන් ක්‍රමය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ හා මහා භාණ්ඩාගාරයේ සහයෝගීත්වයෙන් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලදී. කෙසේ වෙතත්, කූපන් ක්‍රමය ක්‍රියාවට නැංවීමේදී ඇති වූ පාලන ක්‍රමවල දුර්වලතා නිසා මෙම වැඩසටහන තුලින් බලාපොරොත්තු වූ ප්‍රතිඵල ඉෂ්ට කර ගැනීමට නොහැකි වී තිබුණි. ධීවරයන්, තෙල් බෙදා හරින්නන් සහ මෙම කූපන් ක්‍රමය ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ වෙනත් පුද්ගලයින්ගේ අවභාවිතයන් සහ අවකල්ක්‍රියාවන් නිසා රජය විසින් 2013 සැප්තැම්බර් මසදී මෙම ක්‍රමය අත්හිටුවන ලදී. විගණනයේදී නිරීක්ෂණය වූ එවැනි අඩුපාඩු පහත දැක්වේ.

(i) ව්‍යාජ කූපන්පත් අමුණා තිබීම, එකම කූපන්පත් දෙවරක් ඉදිරිපත් කිරීම වැනි විවිධ හේතු නිසා බෙදාහරින්නන්ට ප්‍රතිපූරණය කළ යුතු රු.23,790,125ක මුදලක් සංස්ථාව විසින් රඳවා තබා ගෙන තිබුණි.

(ii) වංචනික සහ ද්විගණනය කරන ලද කූපන් සඳහා සංස්ථාව විසින් බෙදුම්කරුවන් වෙත රු. 3,049,375ක් ප්‍රතිපූරණය කර තිබුණි.

(iii) 2012 ජුලි 20 සිට 2013 අප්‍රේල් 30 දක්වා වූ කාලපරිච්ඡේදය තුලදී එක් බෙදුම්කරුවකුට ඉල්ලුම් කළ මුදලට වඩා රු.1,090,175ක් වැඩිපුර ගෙවා තිබුණි.

(iv) 2013 දෙසැම්බර් 31 දිනට ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත රු.176,091,436ක් වැඩිපුර ප්‍රතිපූරණය කර තිබුණි. එසේ වුවත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මෙම මුදල පියවා නොතිබුණු අතර එය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ආපසු ගෙවිය යුතු තැන්පතුවක් ලෙස වෙළඳ හා වෙනත් ගෙවිය යුතු මුදල් යටතේ පෙන්වා තිබුණි.

**(ඊ) ඉන්ධන පිරවුම් ව්‍යාපාර (Bunkering Business)**

පිරිපහදුවේ බොර තෙල් සැකසුම් ක්‍රියාවලියෙන් උපදවන ලද දැවි තෙල් 1500 අවසර ලත් ඉන්ධන පිරවුම්හල් බෙදුම්කරුවන්ට නිකුත් කිරීමෙන් ලද අලාභය සමාලෝචිත වර්ෂය සඳහා රු. මිලියන 1,276.6ක් වූ අතර 2014 දෙසැම්බර් 31 දිනට මෙම බෙදුම්කරුවන්ගෙන් ලැබිය යුතු මුදල රු.මිලියන 1,664.8ක් විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

(i) සංස්ථාවට මෙම නිෂ්පාදනයන්ගෙන් වන අලාභය මඟහරවා ගැනීමට මෙම නිෂ්පාදනය වඩා සකසුරුවම් සහිතව භාවිතා කිරීම සඳහා උචිත සැලැස්මක් සකස් කර නොතිබුණි. 2014 වර්ෂයේ දේශීය හා විදේශීය ගනුදෙනුකරුවන්ට පිළිවෙලින් මෙට්‍රික් ටොන් 54,796ක් සහ මෙට්‍රික් ටොන් 44,138ක් අලෙවියෙන් ලද අලාභය පිළිවෙලින් රු. මිලියන 1,276.6ක් (මෙට්‍රික් ටොන් එකකට රු.23,296ක්) සහ රු. මිලියන 3,219.2ක් (මෙට්‍රික් ටොන් එකකට රු.72,936ක්) වශයෙන් විය.

(ii) ඉන්ධන සැපයුම් ව්‍යාපාර කටයුතු වැඩි දියුණු කිරීම සඳහා කිසිදු අලෙවි ප්‍රවර්ධනයක් සිදු කර නොතිබුණි.

මේ සම්බන්ධයෙන් සංස්ථාවේ සභාපතිවරයා පහත පරිදි කරුණු දක්වා තිබුණි.

*"රට තුල පහළ ඉල්ලුමත් විශේෂයෙන්ම දැවි තෙල් විදුලි බල උත්පාදනය සඳහා යොදා නොගැනීමත් නිසා සංස්ථාවට දැවි තෙල් විදේශීය වෙළඳපොළට විකිණීමට සිදු විය. 2014 වර්ෂය තුලදී ජාත්‍යන්තර නිමි ඛනිජ තෙල් නිෂ්පාදිත මිල වේගයෙන් පහළ බැසීය. නමුත් අතිරේක දැවි තෙල් මෙට්‍රික් ටොන් එකක් MOPS + අධි මිල එ.ජ.ඩො 26 සිට 30 දක්වා වූ පරාසයකට විකිණීමට සංස්ථාවට හැකි විය. කෙසේ වෙතත් ජාත්‍යන්තර වෙළඳපලේ ඉන්ධන තෙල් මිල වට්ටම් කළ MOPS මත පදනම් විය. සංස්ථාවේ පිරිපහදුවේ තත්ත්වය ඉහළ නැංවීමට අපොහොසත් වීම, දැවි තෙල් නිෂ්පාදනය සඳහා ප්‍රධාන හේතුව විය. දේශීය දැවි තෙල් පිරිපහදු පිරිවැය ඉහළ යාම නිසා අලාභයක් වාර්තා විය. මෙය පිරිපහදුව නවීකරණය කිරීමේ කඩිනම් අවශ්‍යතාවය පිළිබඳ පැවසීමකි.*

*පිරිපහදුව නවීකරණය කිරීමෙන් තොරව දේශීයව පිරිපහදු කළ දැවි තෙල් පිරිවැය පහළ දැමිය නොහැක."*


**4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

රටේ ඛනිජ තෙල් නිෂ්පාදිත අවශ්‍යතාවයෙන් දළ වශයෙන් 1/3ක් ආනයනය කෙරෙන බොර තෙල්වලින් දේශීයව පිරිපහදු ක්‍රියාවලිය සිදුකරන සපුගස්කන්දේ පිහිටි සංස්ථාවට අයත් පිරිපහදුවෙන් සපයා ගනු ලැබේ. අඩු පිරිපහදු ඵලදායිත්වය සහ නවීකරණය කිරීමේ ප්‍රමාදයන් හා සම්බන්ධිත පිරිපහදුවේ පුළුල් කිරීම්වල පවතින අඩුපාඩු මත ඇතිවන මෙහෙයුම් දුර්වලතා සංස්ථාවේ මූල්‍ය කාර්යසාධනයට සෘණ බලපෑමක් ඇතිකර තිබුණි.

2013 දී පිරිපහදු කළ බොර තෙල් ධාරිතාවය වන මෙට්‍රික් ටොන් 1,643,218 හා සැසඳීමේදී 2014 වර්ෂයේදී එය මෙට්‍රික් ටොන් 1,760,170 දක්වා වැඩි වී තිබූ නමුත් 2014 දීද ක්‍රියාවලි මට්ටම දිනකට නියම කර ඇති නිෂ්පාදන ධාරිතාව වන ටොන් 6,900 හෙවත් 2014 වර්ෂයට අදාල මෙට්‍රික් ටොන්

2,415,000 දක්වා ළඟා වී නොතිබුණි. 2014 වර්ෂය හා පෙර වර්ෂ දහයක බොර තෙල් ආදානය ( intake) එම වර්ෂවල නිෂ්පාදන ධාරිතාවය හා සන්සන්දනාත්මකව ඊට අනුරූප වර්ෂයන් සමඟ පහත දැක්වේ.

| වර්ෂය | නිෂ්පාදනය සඳහා බොර තෙල් ආදාන ප්‍රමාණය (intake) | | ධාරිතා ඌණ උපයෝජනය | |
|---|---|---|---|---|
| | පවතින ධාරිතාව (මෙට්‍රික් ටොන්) | සත්‍ය උපයෝජනය (මෙට්‍රික් ටොන්) | ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) | ප්‍රතිශතය |
| 2014 | 2,415,000 | 1,760,170 | 654,830 | 27.12 |
| 2013 | 2,415,000 | 1,643,218 | 771,782 | 31.96 |
| 2012 | 2,242,500 | 1,596,058 | 646,442 | 28.83 |
| 2011 | 2,415,000 | 2,003,607 | 411,393 | 17.03 |
| 2010 | 2,242,500 | 1,752,716 | 489,784 | 21.84 |
| 2009 | 2,415,000 | 2,005,915 | 409,085 | 16.94 |
| 2008 | 2,242,500 | 1,870,237 | 372,263 | 16.60 |
| 2007 | 2,415,000 | 1,899,079 | 515,921 | 21.36 |
| 2006 | 2,415,000 | 2,140,132 | 274,868 | 11.38 |
| 2005 | 2,277,000 | 1,977,751 | 299,249 | 13.14 |
| 2004 | 2,415,000 | 2,216,646 | 198,354 | 08.21 |




1969 වර්ෂයේදී ස්ථාපිත වර්ෂ 45 ක් පැරණි වූ මෙම පිරිපහදුවෙන් රටේ වැඩිවන ඛනිජතෙල් නිෂ්පාදිත අවශ්‍යතාවය සැපයීමට නොහැකි වී ඇති අතර, ඉතා අඩු පිරිවැයකට ඉන්ධන නිපදවීම සඳහා පහසුකම් ඇති සහ එමගින් පිරිපහදු මෙහෙයුම් කාර්යක්ෂමව උපරිම කිරීමට හැකිවන නවීන ලෝකයේ උසස් තාක්ෂණයන් සහිත මෙහෙයුම් කෙරෙන වෙනත් පිරිපහදු සමඟ සැසඳීමේ දී මෙම පිරිපහදුව ඉතා අඩු කාර්යක්ෂමතාවයකින් යුතුව මෙහෙයුම් සිදු කරනු ලබයි. කෙසේ වුවද, පිරිවැය ඵලදායිතා ආකාරයෙන් ඛණිජතෙල් නිෂ්පාදිත වෙළඳපොළට සැපයීම තහවුරු කර ගැනීම සඳහා යෝජිත සපුගස්කන්ද තෙල් පිරිපහදුව පුළුල් කිරීම හා නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය (SOREM) ක්‍රියාත්මක කිරීමට ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාවට මෙතෙක් නොහැකි වී තිබුණි. තවද, 2014 දෙසැම්බර් 31 දින දක්වා මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සංස්ථාව විසින් දැරූ රු. මිලියන 837.6 ක මුදල අනාර්ථික ගනුදෙනුවක් ලෙස නිරීක්ෂණය විය.

මේ සම්බන්ධයෙන් සංස්ථාවේ සභාපතිවරයා පහත පරිදි කරුණු දක්වා තිබුණි.

*"අපි විවිධ කාලපරිච්ඡේදයන්හිදී ක්‍රියාවලියේ උපරිම ධාරිතාවයක් ලබා ගැනීම සඳහා විවිධ බොර තෙල් මිශ්‍රණ (මර්බන් + ඕමාන් මිශ්‍රණ) සැකසීමට භාජනය කරන්නෙමු.*

*2014 වර්ෂයේ එක් අවස්ථාවකදී එස්.පී.බී.එම් නලයේ ඇතිවූ ඇණහිටීමක් සමඟ ඇති වූ බොර තෙල් සැපයුමේ හිඟය හේතුවෙන් පිරිපහදුව සම්පූර්ණ මසක පමණ කාලයක් වසා දැමීමට සිදු විය. තවද, ඒ සමඟම තවත් මසක පමණ කාලයක් තුල සිදු කළ පිරිපහදුවේ පුනර්වර්ධන කටයුතු දෙකක් හේතුවෙන්ද නිමවුම් ක්‍රියාවලිය පහළ මට්ටමක පැවතුණි.*

*කෙසේ වෙතත් පිරිපහදුවේ පැරණි උපකරණවල සිදු වන අණහිටීම් හා නිතර සිදුවන පුනර්වර්ධන කටයුතු වළක්වා ගනිමින් පිරිපහදුවේ ලාභදායිත්වය හා මෙහෙයුම් ඵලදායීත්වය නැංවීම සඳහා පිරිපහදුව නවීකරණය කළ යුතුය."*

**4.4 මතභේදයට තුඩුදුන් කරුණු**

**----------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කළමනාකරණ අධ්‍යක්ෂකගේ නිර්දේශය හා සභාපතිතුමාගේ අනුමැතිය මත 2014 දෙසැම්බර් මාසයේදී ජනාධිපතිවරණය ආසන්නව තිබියදී පන්නල ප්‍රදේශයේ ජනතාවට ආහාර ද්‍රව්‍ය බෙදා හැරීම සඳහා වියදම් කර තිබූ රු.6,146,110ක මුදල අධිකාර බලයක් සහිත හා නීත්‍යානුකූල වියදමක් ලෙස සැලකිය නොහැකිය. තවද, ඒ සඳහා මෙම වියදමෙහි සංස්ථාවට ඇති අදාලත්වය සම්බන්ධයෙන් විගණනයේදී සහතික කළ නොහැකි විය.

(ආ) ලංකා විදුලි බල මණ්ඩලය විසින් 2013 සැප්තැම්බර් 30 දින සිට බලපැවැත්වෙන පරිදි සියළු ගෙවිය යුතු ශේෂ දින 14 ක් තුල නිරවුල් කිරීමට එකඟ වී තිබුණු නමුත් එම කොන්දේසියට අනුකූලව කටයුතු කර නොතිබූ අතර, ඒ අනුව මාස තුනේ භාණ්ඩාගාර බිල්පත් නාමික පොළී අනුපාතයට සියයට 0.5ක පොළී අනුපාතයක් එකතු කර 2013 අප්‍රේල් 20 දින සිට බලපැවැත්වෙන පරිදි සංස්ථාව විසින් හිඟ ශේෂ සඳහා පොළී අය කර තිබුණි. නමුත් එය ගෙවිය යුතු වටිනාකමක් ලෙස ලංකා විදුලි බල මණ්ඩලය විසින් හඳුනාගෙන නොතිබුණි.

(ඇ) පසුගිය වසර කිහිපයක සිට සංස්ථාව විසින් ලංකා විදුලි බල මණ්ඩලය සඳහා බල ශක්ති උත්පාදනය වෙනුවෙන් ඉන්ධන ලබා දී තිබූ නමුත් එකී ආයතනවල මෙහෙයුම් කටයුතු තනි තනිව පහසුවෙන් පවත්වාගෙන යාම පිළිබඳ සහතික වීම සඳහා පාර්ශවයන් දෙක අතර විධිමත් ගිවිසුමක් හෝ අවබෝධතා ගිවිසුමක් ඇති කරගෙන නොතිබුණි.

(ඈ) රජයෙන් සංස්ථාවට ලැබිය යුතු භූමිතෙල් සහනාධාරය, සමාලෝචිත වර්ෂය තුලදී සංස්ථාව විසින් රජයට ගෙවිය යුතු තීරු බදු සමග හිලව් කිරීමට මහා භාණ්ඩාගාරය එකඟ වී තිබුණි. ඒ අනුව, 2008 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල භූමිතෙල් සහනාධාරයේ කොටසක් වශයෙන් රු.3,022,774,886ක මුදලක් 2014 වර්ෂයේදී සංස්ථාව විසින් ගෙවිය යුතු තීරු බදුවලට හිලව් කර තිබුණි. එසේ වුවත්, මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු 2008 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල භූමිතෙල් සහනාධාරයේ ඉතිරි ශේෂය ලැබිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබුණි. තවද, ලැබීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් සාක්ෂි නොමැතිව ලැබිය යුතු භූමිතෙල් සහනාධාරය වශයෙන් රු. මිලියන 2,715ක් 2014 වර්ෂයේ ආදායමක් වශයෙන් හඳුනා ගැනීම විචක්ෂණ නොවේ.

(ඉ) යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.2 වගන්තිය සහ 2013 සැප්තැම්බර් 11 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 02/2013 හි උපදෙස් වලට පටහැනිව සංස්ථාව විසින් ආයතනයේ අරමුදල් යොදාගෙන එහි සේවකයන් වෙනුවෙන් උපයන විට ගෙවීමේ බදු (PAYE) වශයෙන් රු. මිලියන 104ක් 2014 වර්ෂය සඳහා ගෙවා තිබුණි.

**4.5 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් වත්කම් එම වත්කම් අත්පත්කර ගත් දින සිටම නිශ්කාර්යව පැවතුණි.

(අ) වනාතමුල්ලේ පිහිටි හල්ගහකුඹුර ඉඩම - එල්පී ගෑස් ව්‍යාපෘතිය සහ ක්‍රීඩා භූමියක් සඳහා රු.මිලියන 10.6කට මෙම ඉඩම අත්කර ගෙන තිබුණි. එසේ වුවත්, මෙම ඉඩම 700ක් පමණ නීති විරෝධී පදිංචිකරුවන් (දුර්වාසීන්) විසින් අත්පත් කර ගෙන තිබුණි.

(ආ) ජංගම එල්පී ගෑස් පිරවුම් උපකරණය - එල්පී ගෑස් සඳහා සිල්ලර ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ අරමුණින් ගෑස් ටොන් 60ක් පැය දහයක් තුල, කිලෝ ග්‍රෑම් 13.5 සිලින්ඩර්වලට පිරවිය හැකි එල්පී ගෑස් පිරවුම් උපකරණයක් 2009 වර්ෂයේදී සංස්ථාව විසින් රු. මිලියන 24කට මිලදී ගෙන තිබුණි. එසේ වුවත්, 2015 අගෝස්තු 31 දින වන විටත් සංස්ථාව විසින් වාණිජ කටයුතු ආරම්භ කර නොතිබුණු අතර එම වත්කම් අත්කරගත් දින සිටම නිශ්කාර්යව පැවතුණි.

(ඇ) මාහේන ඉඩම - ලබා ගත හැකි වූ ලියවිලි අනුව, සංස්ථාව විසින් මෙම ඉඩම අත්පත් කර ගැනීම සඳහා රු. මිලියන 0.625ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද, මෙම ඉඩම සංස්ථාවේ පොත්වල ගිණුම්ගත කර නොතිබූ අතර 1986 වර්ෂයේ සිට එය පෙර අයිතිකරු විසින් භාවිතා කරමින් පැවතුණි.

(ඈ) ආයෝජන - 2014 දෙසැම්බර් 31 දිනට කොටස් වෙළඳ පොළේ ලියාපදිංචි කළ හා ලියාපදිංචි නොකළ සමාගම් හතරක සිදුකර තිබුණු ආයෝජනයෙහි ධාරණ අගය රු. මිලියන 38.63ක් විය. කෙසේ වෙතත් දිගු කාලයක සිට මේවායින් කිසිදු ලාභාංශයක් සංස්ථාවට ලැබී නොතිබුණි. තවද, රු. මිලියන 5ක් ආයෝජන කර ඇති ජාත්‍යන්තර ඛනිජ තෙල් සමූපකාර සංගමයේ පැවැත්ම පිළිබඳව සංස්ථාව නොදනී.

**4.6 අනෙකුත් ආයතන සඳහා මුදා හරින ලද සම්පත්**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තිය ප්‍රකාරව රේඛීය අමාත්‍යාංශය වෙනුවෙන් හෝ වෙනත් රජයේ ආයතනයක් වෙනුවෙන් කිසිදු අවස්ථාවක වියදම් දැරීමට හෝ එහි සම්පත් යෙදවීමට කිසිදු රාජ්‍ය ව්‍යවසායකට අවසර ලබා දී නොතිබුණද සංස්ථා සේවකයින් 51 දෙනෙකු (ජ්‍යෙෂ්ඨ මට්ටමේ සේවකයින් තිදෙනෙකු සහ ද්විතීයික මට්ටමේ සේවකයින් දහ අටදෙනෙකු ඇතුළුව) සහ මෝටර් රථ හතක් අනෙකුත් ආයතනවලට නිදහස් කර තිබූ අතර වටිනාකම රු.මිලියන 50 කට වඩා වැඩි ප්‍රමාණයක් වේතන හා නඩත්තු වියදම් ලෙස 2014 වර්ෂයේදී දරා තිබුණි.

**4.7 මානව සම්පත් කළමනාකරණය**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ අනුමත සේවක මණ්ඩලය වන 3,284 අතුරින් තනතුරු 622ක් හෝ සියයට 19ක් පමණ 2014 දෙසැම්බර් 31 දින වන විට පුරප්පාඩුව පැවති අතර ඉන් සියයට 23ක් විධායක මට්ටමේ තනතුරු නියෝජනය විය. ඒ අනුව, මෙවැනි විශාල

පුරප්පාඩු සංඛ්‍යාවක් තිබියදීත් ප්‍රධාන මෙහෙයුම් ක්‍රියාවලීන්ට බලපෑමක් නොමැතිව ආයතනය පවත්වාගෙන යාම විගණනයට ප්‍රශ්නකාරී විය.

(ආ) සියළුම වර්ග වලින් තනතුරු 7ක් කොන්ත්‍රාත් පදනම මත පුරවා තිබූ අතර ඉදිරි සුරැකුම් (Hedging) ගනුදෙනුවලට අදාලව පවත්වන ලද විනය පරීක්ෂණයක තීරණයක් අනුව හිටපු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) 2009 පෙබරවාරි 11 දින සිට අනිවාර්ය නිවාඩු ලබා ඇති බැවින් 2011 මැද භාගයේ සිට ප්‍රධාන අභ්‍යන්තර විගණක, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) තනතුරේ වැඩ ආවරණය කර තිබුණි.

(ඇ) 2014 දෙසැම්බර් 31 දිනට පැවති තනතුරු පිරවීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

**5. අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයේ අයවැයගත සහ තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සංස්ථාවේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) වෙළඳ සහ වෙනත් ලැබිය යුතු මුදල්
(ආ) වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු මුදල්
(ඇ) ගිණුම්කරණය හා මූල්‍ය කළමනාකරණය
(ඈ) ප්‍රසම්පාදන
(ඉ) සම්පත් උපයෝජනය
(ඊ) මානව සම්පත් කළමනාකරණය
(උ) වත්කම් කළමනාකරණය